**කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශය,**
**වෛද්‍ය පීඨය,**
**ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය, පස්සර, බදුල්ල**
**දු.අං - 055- ................/ වී,තැ - ........................**

# Information for the Next of Kin - Sinhala

ගරු ස්වාමීන් වහන්ස/පූජකතුමනි/මහත්මයාණෙනි/මහත්මියෙනි/මෙනවියකි,

**<u>වෛද්‍ය අධ්‍යාපනය සහ වෛද්‍ය පර්යේෂණ සඳහා මෘත දේහ පරිත්‍යාග කිරීම.</u>**

ඉහත කරුණ පිළිබඳව ඔබගේ ලිපියට/ඉල්ලීමට ස්තුතියි. මරණින් පසු ඔබේ සිරුර වෛද්‍ය අධ්‍යාපනය සඳහ ප්‍රදානය කිරීමට ඔබ තුළ ඇති පරමාර්ථය බෙහෙවින් අගය කරන අතර මෘක ශරීරයක් පරිත්‍යාග කිරීමේදී සැලකිල්ලට ගත යුතු කරුණු ඔබ වෙත ඉදිරිපත් කරමි. මරණින් පසු මෘත ශරීරයේ අයිතිය ඥාතීන්/භාරකරුවන සතුවේ. එබැවින් ඔබ ඒ සඳහා ඥාතීන්ට පහත සඳහන් උපදෙස් දී තිබිම ඉතා වැදගත්ය.

1. මෘත ශරීරයක් පරිත්‍යාග කළ ගැක්කේ ස්වභාවික මරණයක් නම් පමණි.

2. මරණය සිදු වූ වහාම ඒ බව ඥාතීන්/භාරකරුවන් (next of kin) විසින් අධ්‍යයනාංශ ප්‍රධාන/කාර්මික නිලධාරීන් වෙත ජාතික හැඳුනුම්පතද සමග සතියේ දිනවලදී (සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව. 8.00 සිට ප.ව.2.00 දක්වා වේලාවන් තුළදී ඉහත ලිපිනයට හෝ පහත සඳහන් දුරකථන අංකවලට දැනුම් දීමෙන් අවශ්‍ය කටයුතු සලසා ගත හැකිය. එහිදී භාරකරුගේ නම, ලිපිනය, ජානික හැඳුනුම්පත් අංකය හා මෘත දේහය බහාලු පෙට්ටිය පිළිබඳ අවසන් නිගමනය දැනුම් දිය යුතුය.

    (අ) 055-......,055-................. (අංශ ප්‍රධාන, කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශය)

    (ආ) 055-............................ ( කාර්යාලය, කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශය)

3. මෘත ශරීර බාරගනු ලබන්නේ සතියේ දිනවලදී (සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව 8.00 සිට ප.ව.2.00 දක්වා 'වේලාවන් තුළදී පමණි. සෙනසුරාදා, ඉරිදා සහ රජයේ නිවාඩු දිනවලදී බාරගනු නොලැබේ.

4. කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශය සඳහා මෘත ශරීර බාරගනු ලබන ආකාර දෙකකි.

(අ) මරණය සිදුවී පැය 12ක් ඇතුළත මෘත ශරීරය කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශයෙන් විමසීමකින් පසුව පරිත්‍යාග කිරීම.
මෙම ක්‍රමයේදී මෘත ශරීරය එම්බාම් කිරීම අවශ්‍ය නැත. මරණය සිදුවී පැය 12ක් ඇතුළත මෘත ශරීරය වෛද්‍ය පීඨයේ කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශයට ළඟා විය යුතුය.
මෙය සිදුකළ හැක්කේ සතියෙ කර්යාල විවෘතව පවතින දිනවල (සඳුදා සිට සිකුරාදා දක්වා) පෙ.ව 8.00 සිට ප.ව.2,00 දක්වා වේලාවන් තුළ දී පමණි.

(ආ) මරණය සිදුවී දින තුනක් ඇතුළත මෘත ශරීරය පරිත්‍යාග කිරීම.
මෙහිදී එම්බාම් කළ යුත්තේ පාදයේ කලවා පෙදෙසේ ඉහළ කොටසේ ඉදිරියෙන් පිහිටි ඌර්ව ධමනිය තුළින් ස්වාරක්ෂක තරලය (ෆෞමලීන්) ශරීරයට ඇතුළු කිරීමෙනි. එම්බාම් කිරීමේදී තනුක නොකරන ලද ෆෝමලීන් ද්‍රාවණයකින් ලීටර 05 ක් මෘත ශරීරයට ඇතුළු කළ යුතුය. මෘත ශරීරය පරිත්‍යාග කරන අවස්ථාවේදී එම්බාම් කිරීම නිසි ලෙස සිදුවී නොතිබුනහොත් එය භාරගැනීමට අපහසු වන අතර ඉන ප්‍රයෝජනයක් ගත නොහැකි බව කරුණාවෙන් දන්වමි;

* **එමෙන්ම ශරීරයේ අනෙකුත් කිසිදු කොටසකට හානි නොවී තිබිය යුතුය.**

5. මෘත ශරීරය බාර දීමට පෙර ශරීර අවයව දන් දීම
අක්ෂිදාන සංගමයට (055-2692051,055-2698040, 055-2 698041,055-2698043)) මියගිය තැනැත්තාගේ ඇස් දන් දීම ගැන විරුද්ධත්වයක් නොමැත, (ශරීරයේ වෙනත් කොටසක් කැපීම හෝ ඉවත් කිරීම නොකළ යුතුය).

6. දේහය භාරදීමේදී භාරකරු පහත ලියකියවිලි කාර්යාලයට භාරදිය යුතුය.
    1. උපත, මරණය සහ විවාහ/වෛද්‍ය රෙජිස්ට්‍රාර්වරයාගේ මරණ සහතිකය (මුල් පිටපත) සහ ඡායා පිටපතක්
    2. දේහය භාර දෙන පුද්ගලයාගේ ජාතික හැඳුනුම්පතේ පිටපතක්
    3. නියමිත පරිදි පුරවන ලද දිවුරුම් ප්‍රකාශය

7. පහත සඳහන් ආකාරයේ මෘත ශරීර පරිත්‍යාග කළ නොහැකිය.
    1. අවුරුදු 21 ට අඩු
    2. මිය යන අවස්ථාවේදී සමේ වණ, කුෂ්ඨ, දද, ඒඩ්ස්, කොවිඩ්-19 වයිරසය, සෙංගමාලය වැනි බෝවෙන රෝග වැළදී තිබීම.
    3. නිසියාකාරව එම්බාම් නොකර වෛද්‍ය පීඨයට භාරදෙන අවස්ථාවේදී නරක් වී තිබෙන මෘත ශරීර
    4. හදිසි අනතුරුවලට භාජනය වීම
    5. පිළිකා වැළදී තිබීම
    6. පශ්චාත් මරණ පරික්ෂණ වලට භාජනය කරන ලද මෘත ශරීර

8. මෘත දේහයක් ප්‍රදානය කිරීමට පැමිණෙන පුද්ගලයන් විසින් සැලකිලිමත් විය යුතු අනෙක් කරුණු මෙසේය.

(අ) වෛද්‍ය විද්‍යා පීඨයට ප්‍රදානය කළ මෘත දේහයක් යළිත් භාරදීමක්/ දැක ගැනීමට කිසිවෙකුටත් (උදා: ඥාතීන් හෝ භාරකරුවන්ට) අවසර නොලැබේ.

(ආ) වෛද්‍ය පීඨය විසින් ප්‍රවාහන පහසුකම් හෝ වියදම් සපයනු නොලැබේ.

(ඇ) වෛද්‍ය පීඨය තුළ ආගමික හෝ වෙනයම් උත්සවයක් පැවැත්වීමට අවසර නොලැබේ.

(ඈ) මෘත දේහ ප්‍රදානය සඳහා වෛද්‍ය පීඨයට කිසිදු ගෙවීමක් කළ යුතු නැත.

(ඉ) දේහය ප්‍රදානය කළ පසු පෙට්ටිය, ඇඳුම් සහ පැළඳ සිටි ආභරණ වෙතනොත් ඒවාද නැවත භාරදෙනු ලැබේ.

(ඊ) වෛද්‍ය පීඨයේ අධ්‍යාපන කටයුතු සඳහා අස්ථි ඇටසැකිලි සකස් කළ හැකි නමුත් බාහිර සිසුන්ට/වෛද්‍ය සිසුන්ට වෙළඳාම් කිරීම තහනම් වේ.

අවශ්‍ය වැඩිදුර උපදෙස් සඳහා කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශයෙන් විමසන්න. මෘත ශරීර පරිත්‍යාග කිරීම සඳහා උපදෙස් ඇති පිටු අංක1-2 ඔබ හෝ ඔබගේ ඥාතියෙකු ළඟ සුරැකිව තබන්න.මෙම විස්තර පත්‍රිකාවේ විශ්ව විද්‍යාලයීය පිටපත (3) අපහට ලැබෙන්නට සලස්වන්න.

රජයේ නිවාඩු දිනයන්,සෙනසුරාදා,ඉරිදා දිනයන් වලදීත්,ඉඩකඩඩ ප්‍රමාණවත් නොවන අවස්ථාවන් වලදීත් මෘත ශරීර භාර නොගන්නා බව කරුණාවෙන් සලකන්න. මෘත ශරීරය පරිත්‍යාග කිරීම සම්බන්ධයෙන් ඔබ දක්වන සැලකිල්ල ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලයේ වෛද්‍ය පීඨය ඉතා අගය කොට සලකයි.

........................................................

අංශ ප්‍රධාන/ කායව්‍යවච්ඡේද අධ්‍යයනඅංශය,
වෛද්‍ය පීඨය,
ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,
පස්සර, බදුල්ල

........................................................

පීඨාධිපති,
වෛද්‍ය පීඨය, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය,
පස්සර, බදුල්ල

මූලාශ්‍රය: වෛද්‍ය පීඨය, ශ්‍රී ජයවර්දනපුර විශ්වවිද්‍යා මෙනවිය ලය, සැකසුම: සැකසුම: නිශාදි සචින්තනී මෙනවිය, ආචාර්ය ගයාත්‍රී රත්නායක, එස්. ඉන්දූජා මෙනවිය, කල්පනී සෙනවිරත්න මෙනවිය, වෛද්‍ය අනුත්තරා පතිරගේ, මහාචාර්ය එම්. විදානපතිරණ, වෛද්‍ය පීඨය, ඌව වෙල්ලස්ස විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව